සැ. යු.– 2007.02.09 දින පළවූ අංක 1,484 දරණ *ගැසට් පත්‍රයේ* IV (අ) සහ II කොටස කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,485 - 2007 පෙබරවාරි 15 වැනි බ්‍රහස්පතින්දා - 2007.02.15

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | – | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 127 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 122 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 127 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- කරුණා සමාධි සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 දෙසැම්බර් මස 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2007 ජනවාරි මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

රසායනික අවි සම්මුතිය පිළිබඳ පනත් කෙටුම්පත 2007 ජනවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* **II** වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 පෙබරවාරි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 පෙබරවාරි මස 09 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව

### දෙපාර්තමේන්තුව පාවිච්චියට නොගන්නා හා අබලන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ පාවිච්චියට නොගැනෙන හා අබලන් භාණ්ඩ, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත 2007.03.03 දින පෙ.ව.10.00 ට මෙම කාර්යාල භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලේකම්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

03. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා කාර්යාල භූමියෙන් ඉවත් කරගත යුතු අතර, සියළුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුය.

04. දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන අවම ලංසුව නො පිලිගැනෙන අවස්ථාවේ දෙපාර්තමේන්තුවේ අභිමතය පරිදි, එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය දෙපාර්තමේන්තුව සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම් පත ඉදිරිපත් කළ යුතුය.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

එන්. ඩබ්. ගුණදාස,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

### භාණ්ඩ විස්තරය

| | | |
|---|---|---|
| 1. | රෝනියෝ යන්ත්‍ර | 01 |
| 2. | ඡායාස්ථිත යන්ත්‍ර | 01 |
| 3. | වේලාසටහන් යන්ත්‍ර | 01 |
| 4. | දුරකථන පද්ධති | 01 |
| 5. | යතුරු ලියන | 03 |
| | පැසිස්ට් (ඉංග්‍රීසි) | 1742-49 |
| | කැනන් (ඉංග්‍රීසි) | 321222993 |
| | ඔලිම්පියා (ඉංග්‍රීසි) | 6735111 |
| 6. | දැව අල්මාරි | 03 |
| 7. | බිත්ති ඔරලෝසු | 03 |
| 8. | පන්වර් | 01 |
| 9. | ලියුම් රඳවන ෆයිල් | 01 |
| 10. | වානේ කැබිනට් | 02 |
| 11. | විදුලි පංකා | 11 |
| 12. | විදුලි ස්විච් | 09 |
| 13. | හම්බෑග් | 04 |
| 14. | විදුලි හීටර් | 01 |
| 15. | බන්දේසි | 01 |
| 16. | ක්‍රිකට් භාණ්ඩ | 08 |
| 17. | ප්ලාස්ටික් බාල්දි | 01 |
| 18. | නම් කළ නොහැකි අබලි ද්‍රව්‍ය තොගයක් | |

02-446

## හෝමාගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හෝමාගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදාලව රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද හා නඩු අංක සොයාගත නොහැකි පහත සඳහන් භාණ්ඩ 2007.02.24 දින පෙ.ව. 10.00ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙහි වෙන්දේසි කරනු ලබන කිසියම් භාන්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 9.00 සිට 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළයුතුය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාන්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිවේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතුය.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ජී. එස්. එදිරිසිංහ.
දිසා විනිසුරු මහෙස්ත්‍රාත් - හෝමාගම.

2007 ජනවාරි මස 18 වැනි දින,
හෝමාගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | 31342 | | නැෂනල් වර්ගයේ පැනසොනික් වර්ගයේ කැසට් රේඩියෝ | 1 |
| 2 | 32290 | | 062008 ෆැක්ට්‍රි ලේබල් වලින් යුත් ටී ෂර්ට් | 14 |
| 3 | 64935 | | උළු කැට | 72 |
| 4 | 39223 | | නයිටි | 3 |
| 5 | 32187 | | යුනික් වර්ගයේ රේඩියෝ | 1 |
| 6 | 45573 | | උදළුතල | 1 |
| 7 | 46019 | | ඉමෙජන්සි ලාම්පු | 1 |
| 8 | 47280 | I | Soney වර්ගයේ කුඩා කැසට් රේඩියෝ | 1 |
| | | II | කැසට් පීස් | 2 |
| 9 | 49920 | I | මොන්ඩියා වර්ගයේ අත් ඔර්ලෝසු (නිකල් පටිය සහිත) | 1 |

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| | | II | නිල්පාට ඩයලය සහිත අත් ඔරලෝසු | 1 |
| | | III | Sitizen වර්ගයේ අත් ඔරලෝසු | 1 |
| 10 | 56111 | | නේර්ටින් වර්ගයේ කළුපාට සහිත අත් ඔර්ලෝසු | 1 |
| 11 | 56115 | | දම්පාට ටයිම්පීස් ඔර්ලෝසු | 1 |
| 12 | 78954 | | ගෑස් සිලින්ඩර | 1 |
| | | | ගෑස් ලිප් | 1 |
| 13 | 38148 | | පිහන් ගඩොල් 65 අඩංගු පෙට්ටි | 1 |
| 14 | 25235 | I | පුටු | 2 |
| | | II | රගර් බෝල | 1 |
| | | III | ලන්තෑරුම් | 1 |
| 15 | 55662 | I | පිරිමි ඔරලෝසු | 2 |
| | | II | කාන්තා ඔරලෝසු | 1 |
| | | III | ඉමිටේෂන් වළලු | 2 |
| 16 | 31727 | | කොට්ට උර | 2 |
| 17 | 27976 | | ටීෂර්ට් | 6 |
| 18 | 17699 | | ගියර් පෙට්ටියට සවිකරන ප්‍රයිවීල් බ්‍රේක් | |
| | | | ලයිනර් සමග හවුසින් | 1 |
| 19 | 38636 | | ස්පීකර් | 20 |
| 20 | 45313 | | ගේට්ටු කුළුනට සවිකරන පහන් | 1 |
| 21 | 61977 | | ඇලොයිවීල් | 1 |
| 22 | 38068 | I | බණ්ඩි කියත් | 1 |
| | | II | ලී මිට සහිත පොරව | 1 |
| | | III | යකඩ ඉනි | 1 |
| 23 | 42095 | | වතුර මෝටරය | 1 |
| 24 | 51065 | I | ඇලුමිනියම් තාච්චි | 3 |
| | | II | අලුමිනියම් නැඹිලි | 2 |
| | | III | ඇලුමිනියම් මැටි කෝප්ප | 2 |
| 25 | A.R. 3623 | I | ග්‍රයින්ඩර් | 1 |
| | | II | බෑග් | 1 |
| | | III | සාරි | 2 |
| 26 | A.R.4494 | I | පාපැදි | 1 |
| | | II | පාපැදි | 1 |
| | | III | කළුපාට පාපැදි | 1 |
| 27 | 51178 | | පාපැදි | 1 |
| 28 | 47506 | | පාපැදි | 1 |
| 29 | A.R..3831 | | 118-4672 යතුරු පැදි | 1 |
| 30 | A.R. 4455 | | 139-2379 යතුරු පැදි | 1 |
| 31 | A.R.5640 | | 124-7524 යතුරු පැදි | 1 |
| 32 | අංක රහිත | | 108-1953 යතුරු පැදි | 1 |
| 33 | අංක රහිත | | 101-8926 යතුරු පැදි | 1 |
| 34 | අංක රහිත | | වැසි අංක A-109-122671 යතුරු පැදි | 1 |
| 35 | අංක රහිත | | වැසි අංක AC-04-1005443 යතුරු පැදි | 1 |
| 36 | අංක රහිත | | වැසි අංක MD 08-5000122 යතුරු පැදි | 1 |
| 37 | අංක රහිත | | වැසි අංක 464-001613 යතුරු පැදි | 1 |
| 38 | අංක රහිත | | 130-1548 යතුරු පැදි | 1 |
| 39 | ඒආර්3688 | | 20 1-8845 ත්‍රීවීල් | 1 |
| 40 | ඒආර්5647 | | 128-2294 යතුරු පැදි | 1 |
| 41 | ඒආර්5648 | | 13 ශ්‍රී 1921 කාර් රථ | 1 |
| 42 | බී 7968 | | 103-5239 යතුරු පැදි | 1 |
| 43 | 26427 | | 123-2481 යතුරු පැදි | 1 |
| 44 | බී3576 | I | 108-2606 යතුරු පැදි | 1 |
| | | II | 92-3429 යතුරු පැදි | 1 |
| 45 | අංක රහිත | | 12 ශ්‍රී 8844 ත්‍රීවීල් රථ (යකඩවලට) | 1 |
| 46 | 50800 | | 16 ශ්‍රී 7412 ත්‍රීවීල් රථ (යකඩ වලට) | 1 |
| 47 | අංක රහිත | | යතුරු පැදි 10 කොටස් (යකඩ වලට) | |
| 48 | ඒආර්3836 | I | රන් වළලු | 1 |
| | | II | රන් මුදු | 1 |
| | | III | රන් පෙන්ඩන් | 1 |
| | | IV | රන් ජිප්සි | 2 |
| | | V | රන් ජිප්සි කරාබු | 2 |
| | | VI | රන් ජිප්සි කරාබු | 2 |
| | | VII | රන් කරාබු | 2 |
| | | VIII | රන් කරාබු | 2 |
| | | IX | රන් කරාබු | 2 |
| | | X | රන් කරාබු | 2 |
| 49 | ඒආර් 3837 | | නිල් ගලක් ඇල්លු රන් මුදු | 1 |
| 50 | ඒආර් 3839 | | රන් කරාබු | 2 |
| 51 | ඒආර් 5267 | I | රන් මාල 01 + පෙන්ඩනය | 1 |
| | | II | රන් මුදු (පිරිමි) | 1 |
| 52 | ඒආර්5268 | | රන් අත් පළඳනා | 1 |
| 53 | 11506 | I | රන් මුදු | 1 |
| | | II | රන් පෙන්ඩන් | 1 |
| 54 | 14435 | | රන් ජිප්සි කරාබු | 2 |
| 55 | 17212 | I | රන් මාල (රත්තරන් නොවේ) | 1 |
| | | II | රන් කරාබු | 2 |
| | | III | රන් සූරයක කොටස් | 1 |
| 56 | 27762 | | රන් මුදු | 1 |
| 57 | 30320 | | රන් වළලු | 1 |
| 58 | 30952 | | රන් මුදු | 1 |
| 59 | 14660 | I | රන් පෙන්ඩන් | 1 |
| | | II | රන් කරාබු | 2 |
| | | III | රන් කරාබු | 2 |
| 60 | 22392 | | රන් ගුලි | 1 |
| 61 | 29730 | | රන් මාල | 1 |
| 62 | 46019 | I | කුඩා රන් මුදු | 2 |
| | | II | කොටස් 3 කැඩී ඇති බ්‍රේස්ලට් | 1 |
| 63 | | | අහල් 2 x 2 කොටු දැල් කැබැලි | 6 |
| | | | 2/3'-6" x 4' - 6" | |
| | | | 4/3'-0" x 2' -0" | |
| 64 | | | ඇස්බැස්ටස් රැලි තහඩු තොගය | |
| | | | 4/6'-0" | |
| | | | 9/10'-0" | |
| | | | කැබලි 21 (ප්‍රයෝජනයට ගත හැකි) | |
| 65 | | | මුදුන් උළු කැට | 6 |
| 66 | | | අහල් 3 1/2 දිය බස්නා නල (down pipe) තොගය | |
| 67 | | | හතරැස් හා රවුම් වැහි පීලි තොගය | |
| | | | 13/10' -0" | |
| | | | 6/6'-0" | |
| | | | 10/12"-0" | |
| | | | 4/3'-6" | |
| 68 | අංක රහිත | | ආයුධ පෙට්ටි | 1 |
| 69 | අංක රහිත | | තහඩු කැබැලි ප්‍රින්ටින් ප්ලේට් | |
| 70 | අංක රහිත | | වාහන කොටස් අඩංගු පෙට්ටි | 1 |
| 71 | අංක රහිත | | අබලන් විදුලි ස්ත්‍රික්ක | 1 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 72 | අංක රහිත | අබලන් වාහන කැසට | 1 |
| 73 | අංක රහිත | Sitizon බිත්ති ඔරලෝසු | 1 |
| 74 | අංත රහිත | කොළපාට ඔරලෝසු | 1 |
| 75 | අංක රහිත | Unic රේඩියෝ | 1 |
| 76 | අංක රහිත | Cosmo රේඩියෝ | 1 |
| 77 | අංක රහිත | ටොෂිබා රේඩියෝ | 1 |
| 78 | අංක රහිත | බිත්ති ඔරලෝසු | 1 |
| 79 | අංක රහිත | අත් ඔරලෝසුව, බිත්ති ඔරලෝසුව | |
| 80 | අංක රහිත | National Panasonic වර්ගයේ කැසට් | 1 |
| 81 | අංක රහිත | Sanyo කැසට් රෙකෝඩර | 1 |
| 82 | අංක රහිත | Side කණ්නාඩි | 2 |
| 83 | අංක රහිත | Sharp කැසට් රෙකෝඩර් | 1 |
| 84 | අංක රහිත | මකීටා යතුගාන මැෂින් | 1 |
| 85 | අංක රහිත | යකඩ කපන කියත සහ අඬුව | |
| 86 | අංක රහිත | පුනීල පාර්සල් | 1 |
| 87 | අංක රහිත | බිත්ති ඔරලෝසු | 1 |
| 88 | අංක රහිත | කේතල් (පෝච්චියක්) | 1 |
| 89 | අංක රහිත | හෙල්මට් | 2 |
| 90 | අංක රහිත | හෙල්මට් | 3 |
| 91 | අංක රහිත | මල්පෝච්චි | 2 |
| 92 | අංක රහිත | බෆල් | 1 |
| 93 | අංක රහිත | ලඹයක් | |
| 94 | අංක රහිත | ත්‍රීවීල් රේඩියෝ | 1 |
| 95 | අංක රහිත | විවිධ වර්ගයේ සෙරෙප්පු | |
| 96 | අංක රහිත | තරාදි | 3 |
| 97 | අංක රහිත | වයර් රෝල් | 2 |
| 98 | අංක රහිත | රේඩියේටර් | 1 |
| 99 | අංක රහිත | වීදුරු තහඩු | 1 |
| 100 | අංක රහිත | සවල් | 1 |
| 101 | අංක රහිත | ගල්ඉනි | 2 |
| 102 | අංක රහිත | පොරව | 1 |
| 103 | අංක රහිත | ලිප් (විවෘත) | 1 |
| 104 | අංක රහිත | මෝටර් | 3 |
| 105 | අංක රහිත | වයර් රෝල් | 4 |
| 106 | අංක රහිත | ජැක් | 1 |
| 107 | අංක රහිත | ටකරන්, තහඩු කැබලි | 10 |
| 108 | අංක රහිත | අබලන් රේඩියේටර් | 1 |
| 109 | අංක රහිත | ලයිට් කවර(වාහන), සොකට් ෂෝපර් සහ බයිසිකලයක කොටස් | |
| 110 | අංක රහිත | ඔට්ටපාලු පොහොර උර | 4 |
| 111 | අංක රහිත | පොලිෂ් ටින් | 3 |
| 112 | අංක රිහත | බෝතල් මූඩි ගසන මැෂින් | 1 |
| 113 | අංක රහිත | රබර් තැටි | 52 |
| 114 | අංක රහිත | පුළුන් ගෝනියක් | 1 |
| 115 | අංක රහිත | කිරි බෝතල් රඳවන | 1 |
| 116 | අංක රහිත | බෑග් 07ක් අඩංගු පොහොර උර | 1 |
| 117 | අංක රහිත | බේසන් | 3 |
| 118 | අංක රහිත | ටයිල් තොගයක් | |
| 119 | අංක රහිත | යකඩ ස්ටෑන්ඩ් | 3 |
| 120 | අංක රහිත | ප්ලාස්ටික් රාක්ක (අඩි 02ක් පමණ උස) | 1 |
| 121 | අංක රහිත | වීදුරු | 6 |
| 122 | අංක රහිත | ටී ෂර්ට් තොගයක් | |
| 123 | අංක රහිත | මිනි ගෙඩිය සහ තංගුස් ලණුවක් | |
| 124 | අංක රහිත | පැදුරු | 2 |
| 125 | අංක රහිත | අඩු කිහිපයක් (කතුරු වැනි) | |
| 126 | අංක රහිත | කුඩා කැසට් | 1 |
| 127 | අංක රහිත | පීරි තල කිහිපයක් | |
| 128 | අංක රහිත | ස්ටෑන්ඩ් ෆෑන් (අබලන්) | 1 |
| 129 | අංක රහිත | පිහි කිහිපයක් | |
| 130 | අංක රහිත | ඇලිස් කටු කිහිපයක් | |
| 131 | අංක රහිත | පාපැදි | 3 |
| 132 | අංක රහිත | රේසින් වර්ගයේ පා පැදි | 1 |
| 133 | අංක රහිත | අබලන් ටකරන් තහඩු කැබැලි | 5 |
| 134 | අංක රහිත | වැල්ඩින් කූරු පොහොර උර | 2 |
| 135 | අංක රහිත | ප්ලාස්ටික් පැදුරු | 2 |
| 136 | අංක රහිත | ස්ටියරින් වීල් | 1 |
| 137 | අංක රහිත | දුනුකොළ පටි මීටි | 1 |
| 138 | අංක රහිත | විවෘත ගෑෂ් ලිප් | 2 |
| 139 | අංක රහිත | ඉල්ලංකුරු | 2 |
| 140 | අංක රහිත | යකඩ කුරු | 1 |
| 141 | අංක රහිත | කැටයම් කපන ලද ලී කණු | 2 |
| 142 | අංක රහිත | කටු කම්බි රෝලක් | |
| 143 | A.R. 6364 | 145-0708 යතුරු පැදි | 1 |
| 144 | A.R. 5830 | 114-2440 යතුරු පැදි | 1 |
| 145 | A.R. 5867 | 132-2942 යතුරු පැදි | 1 |
| 146 | A.R. 6369 | 144-5007 යතුරු පැදි | 1 |
| 147 | A.R. 6365 | චැසි අංක 31FBEC - 49301 යතුරු පැදි | 1 |
| 148. | A.R 6368 | චැසි අංක 01B 13F - 05697 යතුරු පැදි | 1 |
| 149 | A.R. 6366 | චැසි අංක CF50-2598419 යතුරු පැදි | 1 |

**හෝමාගම දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ කාර්යාලයෙන් ඉවත් කරන ලද කාර්යාල උපකරණ (අබලි)**

| | | | |
|---|---|---|---|
| 150 | | යකඩ පුටු (අබලි) | 12 |
| 151 | | ලී පුටු (අබලි) | 18 |
| 152 | | වානේ කබඩ් ලාච්චු (අබලි) | 9 |
| 153 | | ලී මේස (අබලි) | 13 |
| 154 | | වානේ මේස (අබලි) | 2 |
| 155 | | වානේ අල්මාරි (ලොකු/කුඩා) | 3 |
| 156 | | වානේ රාක්ක | 40 |

02-374

## මහෙස්ත්‍රාත් අධිකරණය - ගංගොඩවිල

ගංගොඩවිල මහෙස්ත්‍රාත් අධිකරණයේ වූ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2002.03.17 දින පෙ.ව. 9.30 ට අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත එදින පෙ.ව. 9.00 සිට පෙ.ව. 9.15 වන තෙක් භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ සම්පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැණුම්කරු ඔහුගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

පද්මිණී. එන්. රණවක ගුණතිලක,
මහෙස්ත්‍රාත් - ගංගොඩවිල.

2007 පෙබරවාරි මස 02 වැනි දින,
ගංගොඩවිල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 1. | බී/614/03 | කපන ලද රෙදි කැබලි ගෝනි 01 යි. |
| 2. | 53871 | කාන්තා ටී ෂර්ට් 266 ක් අඩංගු ගෝනි 01 යි |
| 3. | බීආර්/1845/05 | කොළපාට ටී ෂර්ට් 14 යි |
| | | ලා නිල් පාට ටී ෂර්ට් 7 යි |
| | | කහපාට ටී ෂර්ට් 2යි |
| | | කළුපාට බොටම් 14 යි |
| | | දුඹුරුපාට ටී ෂර්ට් 38යි |
| | | සුදුපාට බැනියම් 29 යි |
| | | රතු බැනියම් 38 යි |
| | | රෝසපාට ටී ෂර්ට් 60යි |
| | | නිල්පාට ටී ෂර්ට් 40යි |
| | | තැඹිලි පාට ටී ෂර්ට් 01 යි (අඩංගු උර 2 යි) |
| | | වර්ගය අපැහැදිලි පාපැදි 01 යි |
| 4. | 59322 | රෙගුයුලේටරය සහිත ගැස්ලිප් 01යි |
| | | නිල්පාට සෙල්ගෑස් සිලින්ඩර් 01 යි |
| | | විශාල ප්‍රමාණයේ පුනීල 01 යි |
| 5. | බීආර්/1778/05 | ශීතකරණ කම්ප්‍රෙසර් 01 යි |
| 6. | ඒආර්/1115/03 | කෙන්වුඩ් වර්ගයේ ස්ටීරියෝ කැසට් ඇම්පියර් 01 යි |
| | | සීරියල් අංක 812032 අංක දරන ට්වුනර් 01 යි |
| 7. | ඒආර්/1089/03 | කුකුලා සහිත අඩි 5 1/2ක් උස පිත්තල පහන් 01යි |
| | | තටු 01ක් සහිත අඩි 3 1/2 ක් පමණ උස කොටස් අඩු පිත්තල පහන් 01 යි |
| | | නිව් ස්ටාර්ඩ්ස් වර්ගයේ එමජන්සි ලාම්පු 01 යි |
| 8 | ඒආර්/1111/03 | කොඩැක් වර්ගයේ කැමරා 01 යි |
| | | කාන්තා අත්ඔර්ලෝසු 01 යි |
| 9. | ඒආර්/1105/03 | කුඩා දම්වැලක් සහිත පිත්තල පහන් 01යි |
| 10. | බී/3813/04 (50609) | විවිධ වර්ගයෙන් යුත් කොට කලිසම් 24යි |
| | | විවිධ වර්ගයෙන් යුත් කොට කලිසම් 83 යි. |
| 11. | 30171 | සෝනි වර්ගයේ කාර් කැසට් යන්ත්‍ර 01 යි |
| 12. | ඒආර්/1803/05 | වී.සී.ඩී. යන්ත්‍ර 01යි |
| | | සෙලෝටේප් වලින් අලවන ලද පරිගනක තැටි 2 යි |
| 13. | ඒආර්/1774/05 | සෝනි එරික්සන් ජංගම දුරකථන 01 යි |
| | | නොකියා ජංගම දුරකථන 2 යි |
| 14 | ඒආර්/1777/05 | කළු පැහැති ජංගම දුරදක්නා 01 යි |
| 15. | ඒආර්/1779/05 | වී.සී.ඩී. යන්ත්‍ර 01 යි |
| | | වී. සී. ඩී. පටි 06 ක් අඩංගු පාර්සල් 01යි |
| | | ජ්ලෑෂ්බැග් සජීවී ප්‍රසංගය තැටි 08යි |
| | | සැළලිහිණි වසන්තය තැටි 03 යි |
| | | විවිධ වර්ගයේ තැටි 04 යි |
| 16. | ඒආර්1779/05 | විශාරද නන්දා මාලිනී ගී තැටි 08 යි |
| | | ජනප්‍රියතම සිංහල ගී තැටි 08 යි |
| | | ටොප් 06 තැටි 19 යි |
| | | සිංහල කැරෝකේ තැටි 16 යි |
| | | වසරේ මියුරි ගී තැටි 31 යි |
| | | ටොප් සන්ස්ටොප් ටොප් තැටි 08 යි |
| | | වික්ටර් රත්නායක තැටි 05 යි |
| | | තොත්ත බබාලා ගී තැටි 11 යි |
| | | කිංස්ලි පීරිස් ආදර ගී තැටි 11 යි. |
| | | රජ ඉබ්බෝ තැටි 12 යි |
| | | සූර පප්පා තැටි 05 යි |
| | | හා හා හරි හාවා තැටි 06 යි |
| | | ජනප්‍රිය ගී එකතුව තැටි 14 යි |
| | | හුදකලා විරාමය ගී තැටි 04 යි. |
| | | දඹදිව වන්දනා තැටි 14 යි |
| | | එයා දන්නවාද මීනා තැටි 03 යි |
| | | මහා පිරිත තැටි 03 යි |
| | | සන්ෆ්ලවර් තැටි 32 යි |
| | | විවිධ තැටි 12 යි |
| | | හින්දි/ඉංග්‍රීසි තැටි 17 යි |
| 16. | ඒආර්/986/05 | පැනසොනික් සුපර් වර්ගයේ ඩෙක් යන්ත්‍ර 01 යි |
| | | දුරස්ථ පාලක 01යි |
| | | පිලිප් වර්ගයේ වීඩියෝ ඩෙක් යන්ත්‍ර 01 යි |
| 17. | ඒආර්/104/06 | අඟල් 24 සැම්සුන් වර්ගයේ රූපවාහිනී 01 යි |
| | | මහන මැෂින් 01 යි |
| 18. | ඒආර්./102/06 | ටෙලසොනික් වර්ගයේ විදුලි පංකා 01 යි |
| 19. | ඒආර්.1116/03 | වොට් 5 බල්බ් 25 ක් අඩංගු වැල් 01යි |
| 20 | ඒආර්.1802/05 | කළුපාට පෙට්ටිය සහිත වයලින් 01යි |
| | | සුදුපාට ප්ලාස්ටික් ස්විච් බෝඩ් 01 යි |
| | | ගැල්වනයිස් බට කැබලි 21යි |
| 21. | ඒආර්/751/03 | මවුන්ටන් වර්ගයේ පාපැදි 01යි |
| | | ස්ප්‍රිඩ්රෝන් වර්ගයේ පාපැදි 01 යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 22. | ඒආර්/164/04 | අංක සී.සී.අයි/1847ඊ දරන වර්ගය අපැහැදිලි පාපැදි 01යි |
| 23. | ඒආර්/826/04 | පාපැදි 01යි |
| 24. | ඒආර්/865/04 | ලොකු පාපැදි 01 යි |
| 25. | ඒආර්/863/06 | රෝස පාට බිම ඇදගෙන යා හැකි බෑග් 01 යි |
| | | කලුපාට කුඩ එකයි 01යි |
| | | පිරිමි සපත්තු ජෝඩු 01 යි |
| 26. | ඒආර්/313/06 | ඩී.ඊ. එච්. 730 දරන කාර් කැසට් යන්ත්‍ර 01යි |
| | | ආර්එෆ් 011549 දරන කාර් කැසට් යන්ත්‍ර 01 යි |
| | | ක්ලිපන් වර්ගයේ කාර් කැසට් යන්ත්‍ර 01 යි |
| | | ටොයෝටා වර්ගයේ කාර් කැසට් යන්ත්‍ර 01 යි |
| | | 05239028 දරන කාර් කැසට් යන්ත්‍ර 01 යි |
| | | Automactal සඳහන් සීකෝ 199 දරන කාර් කැසට් යන්ත්‍ර 01 යි |
| | | Sathers සඳහන් අංක 29029004 දරන කාර් කැසට් යන්ත්‍ර 01 යි |
| 26. | ඒආර්/313/06 | සෝනි වර්ගයේ කාර් කැසට් යන්ත්‍ර 01යි |
| 27 | ඒආර්/101/05 | එරික්සන් ජංගම දුරකථන එකයි 01යි |
| | | මෝටරෝලා ජංගම දුරකථන 02යි |
| | | නොකියා ජංගම දුරකථන 01 යි |
| | | මොබිටෙල් ලාංඡනය සහිත Sagem වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 28. | ඒආර්/103/06 | මෝටරෝලා ජංගම දුරකථන 01යි |
| | | එරික්සන් ජංගම දුරකථන 01යි |
| | | නොකියා ජංගම දුරකථන 05 යි |
| | | ඇල්කටෙල් ජංගම දුරකථන 02 යි |
| | | සීමන්ස් වර්ගයේ ජංගම දුරකථන 01 යි |
| | | සැම්සුන් වර්ගයේ ජංගම දුරකථන 01යි |
| | | මෝටරෝලා වර්ගයේ ජංගම දුරකථන 04 යි |
| | | බැටරි චාජර් 05 යි |
| 29. | ඒආර්/105/06 | ෆ්ලැසර් 01 යි |
| | | දුඹුරු පාට බෑග් 01 යි |
| | | යසිකා කැමරා 01 යි |
| 30. | 57979 | සෙල් වර්ගයේ ගෑස් සිලින්ඩර් 01යි |
| | | ගෑස් ලිප් 01යි |
| 31 | 56802 | ගෑස් ලිප් 01යි |
| | | ගෑස් සිලින්ඩර 01යි |
| | | බැරල් 01යි |
| 32. | 31857(බී/875/02) | අමතර රෝද 01යි |
| 33 | 44160 | ලුමාලා වර්ගයේ ලාංඡනය සහිත පාපැදි 01යි |
| 34 | 49788 | ටයිඇන්ගග් වර්ගයේ රයිස් කුකර් 01යි |
| 35. | 17028 (බී/973/00) | Sharp වර්ගයේ ඩෙක් යන්ත්‍රය හා දුරස්ථ පාලකය |
| 36. | 42647(බී/2339/04) | පිත්තල සරනේරු 30 යි |
| | | පිත්තල හුලං කොපු 05 යි |
| | | පිත්තල දොර සොයිබ 06 යි |
| | | ක්ලිප්සාර් වර්ගයේ ප්ලග් පොයින්ට් 04 යි |
| | | මේන් ස්විච්, ට්‍රිප් ස්විච් සහ බ්‍රේකර් කෑලි 6ක් අඩංගු පෙට්ටි 1 යි |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 37. | බී/1931/03 | දුරකථන කම්බි මීටර් 145 ක් රෝලක් |
| 38. | 46995 | ඔක්සිජන් පොම්ප 05 යි |
| 39. | 17130 (බී/2185/99) | නන්ස්ටික් සාස්පන් 02 යි |
| | | පියන් 02 යි |
| 40. | 57246(2553/05) | එයිට් පෝට් ස්විච් 01 යි |
| | | සිස්කෝ 800 සිරියස් |
| | | රේඩියෝ ඉන්ටපේස් යුනිට් 01 යි |
| | | යූ.ටී.එස්. 01 යි |
| | | පවර් පැක් 01 යි |
| | | සීමන්ස් දුරකථන යුනිට් 01 යි |
| | | සීටාටෙල් දුරකථන රිසිවර් 01 යි |
| | | පවර් කෝඩ් 01 යි |
| | | ඇඩැප්ටර් 01 යි |
| | | කෙනෙක්ටර් 01 යි |
| | | පවර් ස්ටේසන් කෝඩ් 01 යි |
| | | ඒ.සී.බී.සී. ඇඩැප්ටර් 01 යි |
| | | සබිස් ට්‍රයිබර් ටර්මිනල් ඇන්ටනා 01 යි |
| | | ඇන්ටනා කෝඩ් 01 යි |
| 41. | බී/2088/03 | කුඩා බපල් 02 යි |
| | | ජැක් 01 යි |
| 42. | ඒආර්/1035/06 | තිරිවානා ගල්වලින් සාදන ලද බිත්ති ලාම්පු 02 යි |
| | | කුඩා පරිගණක 01යි |
| 43 | 61534 | වට හතරකින් යුත් ගෑස් ලිප් 01යි |
| 44. | 50302(806/05) | විශාල ප්‍රමාණයේ වායු සමීකරණ යන්ත්‍ර 01යි |
| 45. | 48458 (4363/04) | සුපර් ජෙන්ස් වර්ගයේ ඩෙනිම් කලිසම් 01යි |
| 46 | 40892 | ඩෙනිම් කලිසම් 01 යි |
| 47 | ඒආර්/1040/06 | අමතර රෝද 02 යි |
| 48 | 48458 | නිල්පාට මවුන්ටන් වර්ගයේ පාපැදි 01 යි |
| 49. | ඒආර් 983/05 | විනෝල්ටා වර්ගයේ කැමරා 01 යි |
| | | වී.සී.ඩී. කැසට් යන්ත්‍ර 01 යි |
| 50 | අංක රහිත | විශාල ප්‍රමාණයේ ප්ලාස්ටික් වතුර ටැංකි 01 යි |
| | | **රන් භාණ්ඩ** |
| 51. | ඒආර්/179/03 | ගල් සහිත බ්‍රේස්ලට් 01 යි |
| 52 | බී/346/02 | චේන් 01යි |
| 53. | ඒආර්/174/03 | මුදු 1 යි |
| 54. | ඒආර්/1105/03 | කරාබු 02 යි |
| 55. | බී/346/02 | ජිප්සි 2 යි |
| 56. | ඒආර්/1109/03 | ගල් සහිත පිරිමි මුදු 1 යි |
| 57. | ඒආර්/983/05 | මුදු 1 යි |
| 58. | ඒආර්/177/03 | චේන් 01 යි |
| 59. | ඒආර්/176/03 | මුදු 01 යි, රන් කැබැල්ලක් |
| 60. | ඒආර්/178/03 | චේන් 01 යි |
| 61. | ඒආර්/173/03 | චේන් 01 යි |
| | | චේන් 01 යි |
| 62. | ඒආර්/562/05 | චේන් 01 යි |
| 63. | ඒආර්/983/05 | චේන් 01 යි |
| 64. | ඒආර්/865/04 | මුදු 01 යි |

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

පොල්ගස්ඕවිට, හල්පිට, දවටගහ වත්ත, අංක 69 පදිංචි වන මම පිටුවල ලියනගේ පාලිත ජයරත්න පහත සඳහන් පරිදි දන්වා සිටිමි.

දෝහා කටාර් ශ්‍රී ලංකා තනාපති කාර්යාලයේ පරිපාලන නිලධාරී එම්. ටී. එම්. සරීම් ඉදිරිපිට දී අත්සන් සහතික කර පොල්ගස්ඕවිට, හල්පිට දවටගහවත්ත, අංක 69 පදිංචි මගේ බිරිඳ වන ශිරෝමි ප්‍රියන්කා වික්‍රමසිංහ මගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත්කරමින් 2005.08.02 දින දී පවරන ලද විදේශීය ඇටෝර්නි බලතල මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසිකල බවත්, එකී අය විසින් මින් ඉදිරියට එම බලතල මත කරනු ලබන කිසිදු ගණුදෙනුවකට, ව්‍යාපාරයකට මම වග නොකියන බවත්, ශ්‍රී ලංකා රජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

පිටවුල ලියනගේ පාලිත ජයරත්න.

02 – 576

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

වල්පොල, උඩුගහ වල්පොල, "අනුරාධී" හි පදිංචි බේරුවලගේ නාලිකා ප්‍රියංගනී වන මා විසින් අත්තනගල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. වී. ප්‍රසාද් නිරංජන් මහතා විසින් සහතික කරන ලද 2006.12.07 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් අත්තනගල්ල, අලවල පාර, අංක 598 දරන ස්ථානයේ පදිංචි විජේසිංහ ආරච්චිගේ ජයන්ත ජයතිලක යන අයට පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබේ.

එකී ඇටෝර්නි බලකරු වන විජේසිංහ ආරච්චිගේ ජයන්ත ජයතිලක විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තකට මා විසින් වග කියනු නොලැබේ.

බේරුවලගේ නාලිකා ප්‍රියංගනී.

වර්ෂ 2007 ක්වූ ජනවාරි මස 30 වැනි දින.

02 – 568

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව - මීරිගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

නාල්ල හි පදිංචියට සුදුසු පරිසරයක පිහිටි අක්කර එක (අ. 1, රූ. 0, පර්. 0) සහ අක්කර තුනයි රූඩ් දෙක (අ. 3, රූ. 2, පර්. 0) ක හිස් ඉඩම් කොටස් දෙක මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2007.03.06 වැනි දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේදී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2006.10.13 දින ද, ඩේලිනිව්ස්, දිනමිණ සහ තිනකරන් පුවත්පත්වල 2006.12.15 දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– මීරිගම නගරයෙන් ඇති මීගමුව පාරේ මී. 400ක් පමණ ගියවිට දකුණට ඇති මීරිගම - නාල්ල පාරේ කි. මී. 8 ක් පමණ ගියවිට නාල්ල ගමෙහි පාරට මායිම්ව දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත. කොළඹ - කුරුණෑගල ප්‍රධාන මාර්ගයට මෙම දේපළ සිට දුර මී. 320 ක් පමණ වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මුදුන්ගොඩ, බැලුම්මහර, නුවර පාර, අංක 131, මහජන බැංකුව, බටහිර කලාප III කාර්යාලයේ සහකාර සාමාන්‍යාධිකාරි වෙත ගෙවිය යුතුය.

දුරකථන අංකය : 033-2222325, 033-2226741.
ෆැක්ස් අංකය : 033-2226165.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කල මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ශොක්මන් සහ සමරවික්‍රම,
**ISO** 9001 : 2000 සහතිකය ලත්
පිළිගත් පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ දේපල ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය සහ ප්‍රදර්ශනාගාරය :*
අංක, 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන ,: 081-2224371/2227593.
ෆැක්ස් : 081-2224371.

*නව නාගරික කාර්යාලය සහ වෙන්දේසි ශාලාව:*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන : 011-2502680/2585408.
ෆැක්ස් : 011-2588176.
ඊ මේල්,: samera@sri.lanka.net

02-491

## ඩීඑෆ්සීසී බැංකුව
(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීම

### අංක 9842 සහ 11076 දරන උකස් ඇපකර යටතේ උකස් කරන ලද දේපල විස්තර

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල නගර හා කඩවත් සීමාව තුළ කැන්දලගම පිහිටි පේරමස්කුඹුර නමින් හඳුන්වනු ලබන හා සහතික ලත් මිනින්දෝරු එම්. ෆවුඩ් ඉස්මයිල් විසින් සකස් කරනු ලැබූ අංක 4248 දරන හා 1994.07.25 දිනැති සැලැස්මෙහි ලොට් 06 වශයෙන් නිරූපිත බෙදා වෙන් කරන ලද හා විස්තර කරන ලද බිම් කොටස පර්චස් 14.5 ක් ඉඩම් ප්‍රමාණය සහ එහි පිහිටි ගොඩනැගිලි සහ සියලු දේ සමග ප්‍රවේශ මාර්ගය නිදහසේ පාවිච්චි කිරීමේ අයිතිය ද ඇතුලත් වේ. බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද මහතා විසින් සහතික කරනු ලැබූ අංක 9842 දරන හා 2003 ඔක්තෝබර් මස 07 දිනැති සහ අංක 11076 දරන හා 2005 ජූනි මස 28 දිනැති උකස් බැඳුම්කර යටතේ බදුල්ලේ ජයමහ මුදලිගේ දොන් චාර්ල්ස් ජයන්ත විසින් ඩී. එෆ්. සී. සී. බැංකුව වෙත උකස් කරන ලද දේපළ ආපසු ගෙවා නිදහස් කර ගැනීම පැහැර හැරීම හේතුකොටගෙන ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත ප්‍රදානය කරන ලද බලය යටතේ ඉහත කී දේපල 2007 මාර්තු මස 7 වන බදාදා පෙරවරු 11 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.– මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක් වන විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් 2.5% (සියයට දෙකහමාරක් පමණි),
4. රු. 26,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000 යි,
7. විකිණීමේ ගාස්තු සහ වෙනත් ගාස්තු ඇත්නම්.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක මුදල සමග ශ්‍රී ලංකාවේ රජය හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අය කිරීම් වෙතොත් ඒවා ද, වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුලත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී. එෆ්. සී. සී. බැංකුවේ, නීති දෙපාර්තමේන්තුවෙන් විමසන්න. දුරකථන අංක :011-2440366.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001-2000 සහතිකයලත් ප්‍රසිද්ධ
පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය*:
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය :081-2227593.
දුරකථන/ෆැක්ස් අංකය :081-2224371

*නගර කාර්යාලය*:
අංක 290 හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංක : 2588176.
ඊමේල් : samera@sri.lanka.net.

02-490

## රුහුණ සංවර්ධන බැංකුව-ගන්දර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2007.03.06 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ, පාතේගම පිහිටි පහල කොරටුව *හෙවත්* කෝන්ගහ කොරටුව නමැති ඉඩම මැන සකස් කරන ලද අංක 2590 හා 1998.01.17 වැනි දිනැති පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් රූඩ් තුනයි, පර්චස් විසිදෙකයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 3, පර්. 22.60)ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියළු ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

වැඩි විස්තර සඳහා 2005.12.23 දිනැති *රජයේ ගැසට් පත්‍රය ද*, 2006.12.06 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළකර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*.– මාතර, දික්වැල්ල මාර්ගයේ බෙලිවත්ත කඩපොල අසලින් වම්පසට වැටී ඇති පාතේගම මාර්ගයේ කි. මී. 01ක් පමණ ගිය විට හමුවන දසසිල් අරාමය අසළින් දකුණට හැරී මී. 300ක් පමණ ගිය විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.–වෙන්දේසිය තීන්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් 2 1/2ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු අතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ, අංක 382 ඒ, දරන ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරි මහතාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක :041-2231532, 2226208, 2226209.

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංකය : 041-2228731.

02-487

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - මොණරාගල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඉලංගන්තිලක විසින් සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියා සහතික කරන ලද්දාවූ ද 1998.10.01 වන දින සහ අංක 6184 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හවුපේ හේවාවසම් කීර්තිසේන සහ හවුපේ හේවාවසම් දිලනසිරි ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සී/ස. හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේදී 2007.03.05 වන දින පෙ.ව. 11.00 සිට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල, වැදිරට කෝරළේ, මුප්පනේ පිහිටි බලයලත් මානක එල්. කේ. ගුණසේකර විසින් 1998.03.24 වැනි දින මැන සාදන ලද අංක 1356 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 දරන ඉඩම හා ඒ තුළ පිහිටි සියළු දේත් සමඟ වේ.

විශාලත්වය : රූඩ් 01යි, පර්චස් 38.4.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.20 දින *රජයේ ගැසට් පත්‍රය* හා 2006.10.31 වන දින දි අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5) ක් ද,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු.500)ක් ද,
5. සියළුම ප්‍රචාරක වියදම්,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහ (රු.2,000) ක් ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සී/ස. හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, මොණරාගල ශාඛාව, (දුරකථන අංක 055-2276375, 055-2276214) හෝ කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479, ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අය කිරීම්) දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු,

අංක 34/31, සහ 32
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

02-474